# මෝටර් රථ අමතර කොටස් මුවාවෙන් විස්කි ගෙන්වන ජාවාරමක්

නුගේගොඩ දෙල්කඳ ප්‍රදේශයේ සුප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකුට අයත් මෝටර් රථ අමතර කොටස් ආනයන කරන ව්‍යාපාරික මධ්‍යස්ථානයක මෝටර් රථ අමතර කොටස් උපාංග අතර විදේශිය මත්පැන් තොගයක් සඟවා ඇති බවට වලානේ පිහිටි මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක බලකායේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඉන්දික වීරසිංහ වෙත ලද තොරතුරකට එම බලකායේ අධ්‍යක්ෂ, පොලිස් අධිකාරි, කේ.ඒ. උදය කුමාර මහතා විසින් සකස් කරන ලද සැලසුමකට අනුව උප පොලිස් පරීක්ෂක විමල් ඇතුළු විශේෂ පොලිස් කණ්ඩායමක් යොදවා නුගේගොඩ දෙල්කඳ ප්‍රදේශයේ සුප්‍රසිද්ධ වාහන අමතරට කොටස් ආනයනය කර බෙදා හරිනු ලබන ව්‍යාපාරික මධ්‍යස්ථානයක තිබි **රුපියල් කෝටියක් පමණ වටිනා විදේශිය මත්පැන් තොගයක්** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන කටයුතු සඳහා මිරිහාන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

මෙම විදේශිය මත්පැන් තොගය මොටර් රථ වාහන අමතර කොටස් අනායනය කරනු ලබන ව්‍යාපාරික මධ්‍යස්ථානයේ බිම් මහලේ මෝටර් රථ අමතර කොටස් උපාංග අතර ඉතාමත් සූක්ෂම ලෙස රහසිගත අයුරින් සගවා තිබියදි වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක බලකායේ නිලධාරින් විසින් සොයා ගෙන එහි කළමණාකරුවශයෙන් සිටි 59 හැවිරිදි මහරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

මෙම විදේශිය මත්පැන් තොගය **බේස් නයිට් ක්ලබ්** නමින් කොල්ලුපිටිය සහ කොට්ටාව ප්‍රදේශවල පවත්වාගෙන යන රාත්‍රි සමාජශාලා හිමිකරුවෙකු විසින් එම රාත්‍රි සමාජශාලා වලට නිකුත් කිරීම සඳහා එම ව්‍යාපාරිකයාටම අයත් මෝටර් රථ අමතර කොටස් ආනයනය කරනු ලබන ව්‍යාපාරික මධ්‍යස්ථානයක තොග වශයෙන් තබා ගනිමින් එම ස්ථානයේ සිට මෙම ව්‍යාපාරිකයාගේ රාත්‍රි

සමාජශාලා වෙත ගෙන ගොස් ඇති බවට විමර්ශණයේදි කරුණු අනාවරණය වී ඇත.

විදේශියන් සිට ලංකාවට ආනයනය කරනු ලබන මොටර් රථ අමතර කොටස් ගෙන්වනු ලබන පෙට්ටි තුළට විදේශිය මත්පැන් බෝතල් රිංගවා ඉතා සුක්ෂම ආකාරයෙන් මෙම ව්‍යාපාරික මධ්‍යස්ථානය වෙත ගෙනවිත් ඇති බවට මෝටර් රථ අමතර කොටස් ගෙන්වූ පෙට්ටි පරීක්ෂා කිරීම අනුව නිරීක්ෂණය වන අතර ඒ සම්බන්ධ විමර්ශණ සිදු කෙරේ.

අත්අඩංගුවට ගන්නා ලද විදේශිය මත්පැන් අතර VAT 69, Label 05, Chivas Regal, Baileys, Jack Daniels, Johnnie Walker Black Label, Johnnie Walker Gold label Reserve, Jose Cuervo Especial Blue Agave Silver Tequila, Jose Cuervo Especial Silver Tequila, Absolute Vodka Raspberry ඇතුළු විදේශිය මත්පැන් තොගයක් අත්අඩංගුවට ගෙන ඇත.

තීරුබදු නොගෙවා බලපත්‍ර නොමැතිව විදේශිය මත්පැන් විකිණීම මඟින් **Clean Sri Lanka** ව්‍යාපෘතිය යටතේ ආර්ථික ස්ථායිකරණය සඳහා රජයට අයවිය යුතු බදු මුදල් කෝටි ගණනින් අහිමිවීම සම්බන්ධයෙන් මෙම වැටලීම **පොලිස්පති තුමාගේ සෘජු අධීක්ෂණ යටතේ ක්‍රියාත්මක වන** වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක බලකායේ අධ්‍යක්ෂ, පොලිස් අධිකාරි කේ.ඒ. උදය කුමාර මහතාගේ නියෝග පරිදි ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක ඉන්දික වීරසිංහගේ මෙහෙයවීමෙන් උ.පො.ප. විමල්, පොලිස් සැරයන් 36136 සමරකෝන්, පොලිස් කොස්තාපල් 93728ජයසිංහ, 35039 මධුසංක, 97342 දිසානායක, 98677 රණතුංග, 104678 කුමාර පොලිස් කොස්තාපල් රියදුරු 89631 අබේරත්න යන නිලධාරීන් කණ්ඩායම විසින් සිදු කර ඇත.